අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (cau; தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සිංහල I
சிங்களம் I
Sinhala I

**71 S I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
- ❖ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** හා **(උ)** යන උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** සිටු දුවණියෝත් තුන් විටක් **පැදකුණු කොටලා** සතර තැනෙක සිට වැඳලා "ස්වාමීනි, මේ කෙළවර දැක්මය. මෙවක් පටන් මුඹවහන්සේගේ මා දැක්මකුත් මාගේ මුඹවහන්සේ දැක්මකුත් නැතැ"යි කියාලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙනපියා පිටිපස්සේ සිටත් සිප ගෙනපියා කුමක් දෝහෝයි සිතමින් ගල් කෙළවර පමා ව සිටියහු තුමු පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන ඌගේ කායබල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායාබලය මහත් හෙයින් ගල්මුදුනෙන් දැමූව. හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි විය. සොරපව්වේ වසන දෙවතාවාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දැක 'හැමතැනදී ම පිරිමින් උපදෙස් දනිතී නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිතී' කිවුය.

(i) මෙහි සඳහන් සිටු දුවගේ නම සඳහන් කරන්න.
(ii) මේ සිදුවීම දෙස බලා සිටි දේවතාවා පැවසූයේ කුමක් ද?
(iii) "තමන්ගේ ඥානාකෘති වූ මායාබලය මහත් හෙයින් ගල් මුදුනෙන් දැමූව" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'පැදකුණු කොටලා'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ආ)** එබසට අනුරුද්ධකුමාරයෝ "යහළු, ජරාමරණදෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයෙක් නැත. සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි. තෙලෙ නුවණෙක් නොවෙයි. අප බුදුහු **එකුන්තිස්** ඇවිරිද්දෙහි කාමසුව හැර සත්දවසකින් ලැබෙන සක්විතිරජය හැර මහණ වූහ. උදායින් ආදි වූ මෙම නුවර මහඇමතියෝ ද නව යෞවනයෙහි මහණව අමාමහනිවන් දැක දැන් අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙහි ඇවිදිති. අපි ඔවුන් වඳුම්හ; පුදම්හ; සත්කාර කරම්හ; මෙයිදු ලජ්ජාවකට ඇත. කාමසුව විඳීම නම් නුවණැසින් බැලූ කල සුව විඳීමෙක් නොවෙයි; දුක්විඳීමෙක; එකලාව වලට ගොස් තපස් කිරීම නම් විශේෂයෙන් බැලූ කල දුක් විඳීමෙක් නොවෙයි; ඒකාන්ත සුව විඳීමෙක. යහළු' දෙබසක් නොකියව; මහණ වන්නට යම්හ." යි කීහ.

(i) මෙහි දැක්වෙන අනුපිළිවෙළ නොවැදගත් වන කරුණු දෙක සඳහන් කරන්න.
(ii) මෙහි සුව විඳීමෙක් ලෙස සලකා ඇත්තේ කුමක් ද?
(iii) 'අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙහි ඇවිදිති' මෙය ලිහිල් බසින් ලියන්න
(iv) **'එකුන්තිස්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ඉ)** වැළිත් "මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ වියෝග ශෝකයෙන් හඬා පෙර මා හා සමඟ එක් ව කෙළ ඇවිද ලියමඬුලු වන ලැහැප් අතළ ගල් ගං හිස් ගිරිමුඳුන් රුක් යට වැලිතලාදි වූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තිගේ අදෝනාකම් අපේක්ෂා කරන්නා වූ මම හඬන්නෙමි" යනාදීන් මෙසේ ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තේ ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේ ය. රජ ද විදි තැන ම සිටියේ ය. චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනා තොම මහ බෝසත්හු මෙලෙස හඬතත් තමාගේ කෙළියෙහි ඇලී මත් වන ලද්දී බෝසත්හු විත් කෑ නියාවත් නොදන්නීය. එතකුදු උවත් මහ බෝසත්හු **විසංඥ ව** වැදහොත් නියාව දැක "ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී නියා වූ මගේ නැටුම් නොබලා වැදහෝන්නට කවර දුකෙක් උපන් දැ"යි පරීක්ෂා කොට බලන්නාහු ප්‍රහාර මුඛයෙන් වැහෙන්නා වූ ලේ දැක ප්‍රිය වූ ස්වාමි පුත්‍රයා කෙරෙහි සෝකය දරා ගත නොහී ආක්‍රෝශ බෙණෙමින් මහ හඬින් හඬන්ට වන්හ.

(i) කිඳුරහන බෝසතුන් ඊ පහරකට ලක් වූ බව දැන නොගැනීමට හේතුව කුමක් ද?
(ii) කිඳුරියට ශෝකය දරාගත නොහැකි වූයේ ඇයි?
(iii) 'ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේ ය' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'විසංඥ ව'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

**(ඊ)** එකල නන්දිය වෙළෙඳාණන්ගේ භාර්‍යාවෝ උත්සව බලනු සඳහා ඉස් ශෝධා නහා සර්‍වාභාරණයෙන් සැරහී දාසි සමූහයා පිරිවරා එක් දාසියක ඇඟ එල්බ ගෙන ශරීරභාගයක් පෙනෙන සේ මතු මහල් තෙලෙහි උත්සව බලබලා සිටියහ. එකල්හි අමාත්‍යයා දෙපස **වීථීවින්‍යාස සැරහීම්** බලබලා සතුටු සතුටු ව යනුයේ උඩුමහල් තෙලෙහි සිට වීථිය දසාව බැලූ වෙළෙඳ භාර්‍යාව දැක උන්ගේ රූප නමැති සුරාපානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ඡා ව භ්‍රාන්ත ව ගිය සිත් ඇති ව තද භීයකින් චිත් කෑ මුවකු සේ වෙළෙඳ භාර්‍යාවන්ගේ මඳලස බැලුම් නමැති ශරප්‍රහාරයෙන් මූර්ච්ඡා ව දැසින් වැහෙන කඳුළු ධාරා නමැති රුධිරයෙන් රුඳී විරූපභාවයට පැමිණියා වූ මුහුණු ඇති ව අඬඅඬා පෙරළෙමින් තමා හා එක් ව යන්නවුන් බණවා "එම්බා නෑයෙනි, යහළුවෙනි, මිත්‍රයෙනි, තෙල උඩුමාලේ දෙවඟනක සේ සිටිනෝ කවුරු ද, කාගේ දියෙණි කෙනෙක් දැ"යි විචාළේ ය.

(i) වෙළෙඳ භාර්‍යාව උත්සවය බැලීමට පැමිණ සිටියේ කෙසේ ද?
(ii) අමාත්‍යවරයා පත් වූ අපහසුතාව දැක්වෙන උපමාව කුමක් ද?
(iii) 'වෙළෙඳ භාර්‍යාවන්ගේ මඳලස බැලුම් නමැති ශරප්‍රහාරයෙන් මූර්ච්ඡා ව' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'වීථීවින්‍යාස සැරහීම්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(උ)

මෙන් රිවි සඳ කිරණ
දිව රෑ දිලෙන මෙදෙරණ
ඔහු සොමි ගුණ තෙදණ
කෙළේ මුළු ලොවට වැඩ අපමණ

ඔහු තෙද දිවසකර
දිලිහෙත විකුම් ගිරි සිර
පෙර සිටි රඟ නොහැර
සිටිද පෙර රද යස **තුසරකර**

(i) සඳ - හිරු එළියට සම කොට දක්වන්නේ රජුගේ කවර ගුණයන් ද?
(ii) වික්‍රමය නමැති ගිරි හිසෙහි බැබළෙන්නේ කුමක් ද?
(iii) 'පෙර සිටි රඟ නොහැර' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**තුසරකර**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

- **(ඌ)** සහ **(එ)** ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

**(ඌ)** පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. 'එ විතරක් වී නම් මුසුප්පුවන්ට නොකැමැත්තේය'
ii. 'යම් කිසි කෙනෙකුන්ගේ මුහුණ එක් ඇසකින් හොබින්නේ නොවෙයි'
iii. 'පළමුත් මූ තුමූ තොපට අනර්ථව සිටියෝ වේද'?
iv. 'හුණු කැමති සිහිල ලැබෙල. සිහිල් කැමති හුණු ලැබෙල.'
v. 'කිරි නැතුව ඌ කොච්චර බඩගින්නකින් ද ඉන්න ඇත්තෙ'
vi. 'පොඩි වැඩක් තියෙනව කොරන්න. තව පොඩ්ඩෙදි මේ කතාවෙන් ඒක අමතක වෙනව'
vii. 'ලද්දෙමි වෙමි මගෙ දිවියේ අගනා පල
සුවිසාලය මට අත් වූ වාසනාව'

(ලකුණු 03 x04 = 12 යි.)

**(එ)** ළමා කාව්‍ය නිර්මාණයක විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**සමනලයා**

නුබ තල ළහිරු බබළයි උණුසුම්ය පවන්
බිඟු කැල උරයි වන මල් රොන් රසය නවන්
එහි ලොල නොවී පියඹා ආ ගමන මෙවන්
සමනොල මිතුර නුඹටයි මගෙ ආයුබොවන්

දඹ රන් සුණෙන් හෙබි සිරියල් තලාවක
සුබ සිරි හඳුන්වා සුපුරුදු වෙලාවක
සිඹ සිඹ කුඩා ගස් වන මල් බලා නෙක
නුඹ ආ ගමන සීපද ගායනාවෙක

ගන නිල් තණග පිනි ටික ටික මැකෙද්දී
සුවිසල් අරුණු දද පෙරඹර දිලෙද්දී
රොනවුල් සුළං රළි දකුණෙන් වැදෙද්දී
සිරියල් බිමෙක විද නුඹ හිරු නැහෙද්දී

හේන්වල මුවන් වට පිට බලද්දී
රාං කුරුල්ලන් තුති ගී කියද්දී
පාන්දර හීන් හිරිකඩ වැටෙද්දී
නේන්, හඳුනන්ට බැහැ මල් පිපෙද්දී

තම තුනු කැලුම් සිලිලෙන් නැහැවෙවී වරෙන්
මල් වාරමක ගතියෙන් නැළවෙවී වරෙන්
කවුරුත් නුඹට ආදරයයි, එදැන වරෙන්
සමනොල පුස්පරාගය මා ළඟට වරෙන්

(ලකුණු 12 යි)

**2.** කථා වස්තු රසවත් ව කියාපෑමේ දී ධර්මසේන හිමියන් අවස්ථෝචිත ව උපමා භාවිතයට දක්වන කුසලතාව කෙබඳු දැයි නිර්දිෂ්ට කථා පුවත් ආශ්‍රයෙන් විමසන්න.

**නැතහොත්**

"එකිනෙකට වෙනස් අවස්ථා හමුවෙහි මිනිස් සන්තානයෙහි හටගන්නා සිතුවිලිවල සංකීර්ණ ස්වභාවය නිරූපණය කිරීමෙහි ලා ජාතකකථාකරුවා සමත් වෙයි." නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් මේ අදහස සනාථ කරන්න.

(ලකුණු 15 යි)

**3.** “පුද්ගල හා අවස්ථා වර්ණනයේ දී ධර්මකීර්ති හිමියෝ විවිධත්වයෙන් යුතු ව භාෂාව හසුරුවති.” සද්ධර්මාලංකාරයේ නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් මේ අදහස පැහැදිලි කරන්න.

**නැතහොත්**

සාරවත් ජීවන අත්දැකීම් උකහා ගනිමින් දිවි මග සාර්ථක කර ගැනීම් වස් පූජාවලියෙන් ලැබෙන පිටුබලය කෙබඳු දැයි නිර්දිෂ්ට කථා ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 15 යි)

**4.** **(අ)** කෝට්ටේ අවධිය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීමේ යුක්ති සහගත බව නිදසුන් ඇසුරෙන් පහදන්න.

(ලකුණු 07 යි)

**(ආ)** “ගුත්තිල කාව්‍යයෙහි එන මූසිල තම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා නොපසුබට උත්සාහයෙන් කටයුතු කරන්නෙකි.” උචිත නිදසුන් ඇසුරෙන් පහදන්න.

(ලකුණු 08 යි)

**5.** දුෂ්ට සමාජ බලවේග හා සොබාදහමේ අකාරුණිකත්වය හමුවේ ගැමි ගැහැනුන් පත් වන පීඩාව සානුකම්පික ලෙස ඉදිරිපත් කිරීමට නවකතාකරුවා දක්වන සාමර්ථ්‍යය බැද්දේගම නවකතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

**6.** “පීඩිත පන්තිය මුහුණ දෙන අනේකවිධ දුක්ඛදෝමනස්සයන් නූතන කෙටිකතාකරුවෝ කලාත්මක ව ප්‍රතිනිර්මාණය කරති” නිර්දිෂ්ට කෙටිකතාවලින් සුදුසු නිදසුන් **තුනක් වත්** ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

**7.** අතීතාවර්ජන ලෙසින් හටගත් පුද්ගලානුභූතීන් රසාත්මක ව රසිකයා තුළ ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා නූතන කවීන් ගන්නා ප්‍රයත්නය නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ **තුනක්** වත් ආශ්‍රයෙන් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

**8.** “පෙමතො ජායතී සොකො” නාට්‍යයේ නිරූපිත ස්වර්ණතිලකා ප්‍රායෝගික ජීවිත අත්දැකීම්වලින් හෙබි තැනැත්තියකි” සුදුසු නිදසුන් **තුනක් වත්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

***